# භාරතීය ශ්‍රමණ සම්ප්‍රදාය සහ ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සංස්ථාව තුලනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. තිලක් දේවගිරි බණ්ඩාර

ලියාපදිංචි අංකය : 2003 M.Phil 1658

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණාත්මක නිබන්ධය.

# නිබන්ධ සාරාංශය


ආගමට දිගු ඉතිහාසයක් ඇත. පැරණි ම ආගම වෛදික ධර්මය යි. මානව ශිෂ්ටාචාරය බිහිවීමත් සමග ම පරිසරයේ ඇති සුවිශේෂී වස්තු කෙරෙහි මිනිසා බැලුවේ, ඒවාට මහත් අද්භූත ශක්තියක් ඇත යන ආකල්පයෙනි. ඒ අනුව පෘථිවිය, හිරු, සඳු, තාරකා, වැස්ස, ගින්න වැනි වස්තුවලට දේවත්වයක් ආරෝපණය කරමින්, බිය මුසු හැඟීමෙන් පුද පූජා පවත්වන්නට විය. ඒ බහුදේවවාදී සමය යි. මිනිස් චින්තනයේ යම් යම් චලිතයන් තුළින් ලොව සියල්ල මැවූ එක් දෙවියෙක් ඇත, යන විශ්වාසය මිනිසුන් තුළ ඇති විය. ඒ නිසා බහුදේවවාදය බිහිවිය.

මේ අනුව බිය, දුක සැප, සෞභාග්‍ය පතා බහුදේවවාදී සමාජය තුළ විවිධ පුදපූජා පවත්වන්නට වූහ. ඒ සම්බන්ධව වේද යුගය විශේෂයෙන් වැදගත් ය. වේද මන්ත්‍ර ලෙස දෙවියන් ඉදිරියේ ගායනා කිරීම තුළින් විවිධ අපේක්ෂාවන් ඉටුකරගත හැකි බව විශ්වාස කළෝ ය.

ඍග්, යජුර්, සාම, අථර්වන් වේදවලින් පෙනී යන්නේ එකී තත්ත්වය යි. වේද යුගයේ බ්‍රාහ්මණ ආධිපත්‍යය මුල්බැසගෙන තිබිණ. යාගය කර්ම මාර්ගය විය. යාග කෙරෙහි කළකිරුණු විශාල පිරිසක් බිහි වූහ. උපනිෂද් යුගය වනවිට හරසුන් යාගක්‍රම ගැන කළකිරුණු පිරිස් විමුක්තිය සොයා තනිව ගිහිගෙය අතහැර වනාන්තරගතවීම දැකිය හැකි ලක්ෂණයකි. උපනිෂද් ග්‍රන්ථවලින් ඒ බව තහවුරු වේ. බ්‍රාහ්මණ ආධිපත්‍යයත්, එම යුගයේ වේද, වේද සංහිතා, යාග හෝම, යන්ත්‍ර මන්ත්‍ර ආදිය විශේෂයෙන් අධ්‍යයනයට ලක්කරන ලදී.

ශ්‍රමණ සම්ප්‍රදායක් ආරම්භ වීමට පදනම් වූ ඉන්දු- පෛරාණීය යුගයේ සිට බ්‍රාහ්මණ ආගමික ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සාකච්ඡාවට ලක් කළෙමි. පුළුල් වශයෙන් භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායේ ආරම්භය හා විකාශය තුළින් ප්‍රාග් වෛදික යුගය හෙවත් අනාර්ය අවධියේ භාරතයේ ශ්‍රමණ ආකල්ප හා චර්යාවන් බ්‍රාහ්මණ යුගයේදී එහිලා දක්නට ලැබෙන බිඳවැටීම් හා ආරණ්‍යක, උපනිෂද් යුගවල නැවත පුනර්ජීවයක් ලැබූ අයුරු පෙනී යයි.

බ්‍රාහ්මණ ශ්‍රමණ සම්ප්‍රදායේ සාම්ප්‍රදායිකත්වය, නිස්සාර බව කෙරෙහි දැඩි ලෙස කළකිරුණු බහුතර පිරිසක් විමුක්තිය සෙවීම සඳහා ගිහිගෙය අතහැර අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය යන ප්‍රතිපත්තිවලට අනුගතව කටයුතු කළ හ. අචේලක, පරිබ්‍රාජක හා නිඝණ්ඨ, ආජීවක, ජටිල හා ෂට් ශාස්තෘවරුන් ඒ කණ්ඩායම්වලට ඇතුළත් වේ. පුළුල් ලෙස බ්‍රාහ්මණ නොවන, බෞද්ධ නොවන මෙකී ශ්‍රමණ කණ්ඩායම් හා ඔවුන්ගේ මතවාද, දර්ශන මූලාශ්‍ර භාවිතා කොට තර්කානුකූලව බුද්ධ කාලීන ශ්‍රමණ සම්ප්‍රදාය තුළින් සාකච්ඡා වේ.

භාරතීය දර්ශන ඉතිහාසය පෝෂණය කිරීම ට එමගින් ලැබුණු පිටුබලය ඉමහත් ය. කර්මය, පුනර්භවය, සංසාරය පිළිබඳව අන්තර්ගත අදහස් ද දියුණු තලයක පැවති බව පෙනෙයි. විශේෂයෙන් ජෛන ධර්මය ඇතුළත් සප්තභංගි න්‍යාය, පකුධකච්චායනගේ ලෝකයාතවාදී මතය, සංසාරශුද්ධිවාදය, සුඛපරමවාදය සාකච්ඡාවට බඳුන්කරන ලදී. බ්‍රාහ්මණ යුගය හා බුද්ධකාලීන ශ්‍රමණයන් අතර වූ විශේෂතා ද සාකච්ඡාවට ලක්කෙරිනි. භාරතීය දර්ශන ඉතිහාසයේ පමණක් නොව ලොව පහළ වූ අතිවිශිෂ්ට දර්ශනය වූ බෞද්ධ දර්ශනය, ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායේ ව්‍යාප්තිය අන් ශ්‍රමණ සම්ප්‍රදායන්වලින් ( බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය ) වෙනස්වන අයුරු සූත්‍ර විනය මූලාශ්‍ර උපයෝගි කරගෙන විමර්ශනයට යොමු කෙරිනි. ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායේ හා අන් ශ්‍රමණ සම්ප්‍රදායන්වල පැවති පරස්පරතාවයන් මෙහිදී දැකගත හැකි විය. බුදුරජාණන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය, පෞරුෂලක්ෂණ, නායකත්වය, සංවිධානාත්මක බව ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායෙන් මූර්තිමත් වන අයුරු විදහා දැක්විනි. ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායේ සංවිධානාත්මක බව, භික්ෂු ආකල්ප, සමාචාර විධි, වත් ආදිය විචාරාත්මකව සාකච්ඡාවට භාජනය විය. සමකාලීන ශ්‍රමණ කොටස්වල ආභාෂය බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය වෙත කෙතෙක්දුරට බලපාන ලදදැයි විමසුමට ලක් විය.

නිෂ්ටාව හා උපාය අරබයා බෞද්ධ හා අබෞද්ධ ශ්‍රමණ කොටස් අතර ඇති සුවිශේෂිතා සාකච්ඡාවට ලක් කළ අතර ෂට් ශාස්තෘන් ඇතුළු වෙනත් ශ්‍රමණයන් විසින් ඔවුන්ගේ ධර්මවිනය පිළිබඳව දක්වන විවිධ අදහස්, ඒවායේ සමවිෂමතා මෙහිදී අවධානයට ලක් කළේය. බෞද්ධ ශ්‍රමණයන් උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මවිනය හා ඒ නිෂ්ටාව පිළිබඳ බෞද්ධ මූලාශ්‍රයන්හි දැක්වෙන කරුණුත් එහිලා ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂතාවන් ශාස්ත්‍රීය විමර්ෂනයකට භාජනය කරන ලදී.

සෑම ආගමක් ම තවෙකකින් වෙනස්කම් ඇත. මෙම අධ්‍යයනයෙන් මනාව එය තහවුරු වේ. සෑම ආගමකින් ම ගුණ ධර්ම ගැන සැලකිළිමත් වීමක් දැකිය හැකි වේ. භාරතීය වෛදික ධර්මය, ජෛන ධර්මය හා වෙනත් මතවාද අධ්‍යයනයෙන් එය තහවුරු වේ. එකිනෙකා පිළිගන්නා දෘෂ්ටීන් නිවරැදි යැයි දෘෂ්ටිගතවීම ලෝක ස්වභාවයක් බව පෙනී යයි. එහෙත් නිෂ්ටාව හා චරණය අතර මනා සම්බන්ධතාවක් තිබීමත් දෘෂ්ටිගත නොවීමත් නිසා භාරතීය සමාජයේ අන් සියලුම ශ්‍රමණ සම්ප්‍රදායන්වල පිරිස් බුදු දහමේ රැකවරණය ලද අයුරු සූත්‍ර පිටකය විමසීමෙන් පැහැදිළි වූ කරුණකි. "ගෞතම බුදුරජාණන් වහන්සේ වනාහි සත්‍ය වූ, සැබෑ වූ, ඇත්ත වූ, ස්වභාව ධර්මයේ ඇති තතු නියම තත්ත්වය එළිවන පිළිවල ම පවසන සේක." යනුවෙන් පොට්ඨපාද සූත්‍රයේ පොට්ඨපාද බ්‍රාහ්මණයාගේ ප්‍රකාශයෙන් ද එය තහවුරු වේ. ලෝකයේ යථාර්තය වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ තේරුම්ගෙන මධ්‍යම ප්‍රතිපදාව නැමැති ඒකායන මාර්ගය තුළින් නිෂ්ටාව කරා ගමන් කිරීමේ නිවරැදි නිදහස් මාවතක් ශාක්‍යපුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදාය තුළ ඇති බව බුද්ධකාලීන අන් ශ්‍රමණ සම්ප්‍රදායන් බුදුරජාණන් වහන්සේගේ ධර්ම මාර්ගයට අනුගතවීමෙන් සනාථ වේ.